ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. :

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2022-11-22

පැමිණිලි පාර්ශවය :- 01. ඩී. මුණසිංහ ආරච්චි මහතා,
බී/එල්/52,06 වන මාවත,
අම්පාර.

02. ඒ.එච් ගුණසිරි සිල්වා මහතා,
සී/270/3ඒ,සේනානායකපුර,
අම්පාර.

වගඋත්තර පාර්ශවය :- 01. ප්‍රාදේශීය ලේකම් .
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අම්පාර.

02. නියෝජ්‍ය ඉඩම් කෙමසාරිස්,
නියෝජ්‍ය ඉඩම් කෙමසාරිස් කාර්යාලය,
අම්පාර.

03. ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

පැමිණිලි අංකය :- **HRC/AM/96/16/B/LP**

**HRC/AM/98/16/T/LP**

**පැමිණිල්ලේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් ඩී. මුණසිංහආරච්චි මහතා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් තමා වසර 48ක් අම්පාර ප්‍රෙද්ශයේ ස්ථිර පදිංචිය දරණ බවත්, තමා හට අම්පාර බස්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் : sechrcsl@gmail.com

නැවතුම්පල ඉදිරිපිට අංක 13 දරණ වාණිජ බිම අයත්ව තිබූ අතර, එහි ගොඩනැගිලි සකස්කර සාර්ථකව ව්‍යාපාර කටයුතු ආරම්භ කර තිබියදී අම්පාර බස් නැවතුම්පල සංවර්ධනය කිරීම සඳහා 1978 වර්ෂයේ අදාළ ඉඩම පවරාගත් බවත් එම ඉඩම පවරා ගැනීමේදී අම්පාර නගර සීමාව තුළින් විකල්ප ඉඩමක් ලබාදෙන බවට හා දෙමහල් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම වෙනුවෙන් වන්දි මුදලක් ලබා දෙන බවටත් දිස්ත්‍රික් ලේකම් ලිඛිත පොරොන්දුවක් ලබාදුන් බවත් සඳහන් කර ඇත. ඒ අනුව අම්පාර නගර සභාව එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර අබලි ද්‍රව්‍ය පවා රැගෙන ගිය බවත්, මේ සම්බන්ධව තමා කළ පැමිණිල්ල අනුව අම්පාර ප්‍රාදේශිය ලේකම් විසින් 1997.06.09 වන දින කරන ලද පරීක්ෂණයේ වාර්තා පිටපතක්ද අමුණා ඇති බවත් සඳහන් කර ඇත. ඒ සඳහා වාණිජ ඉඩමක් හෝ වන්දියක් නොලැබීම හේතුවෙන් තමා දිගින් දිගටම නිලධාරින් වෙත කරන ලද ඉල්ලීම් අනුව 2015.04.28 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 4/10/37844 අංක දරණ ලිපියෙන්, 'වාණිජ කටයුත්තක් සඳහා ඉඩමක් දීර්ඝ කාලීනව බදු ඉල්ලීම ධර්මසේන මූණසිංහ ආරච්චි යන ලිපියෙන් සේනානායකපුර ජනපද නිලධාරි විසින් අඳින ලද අනුරේඛනයේ කැබලි අංක "A" වන ප්‍රමාණයෙන් හෙක්.0.0164 පමණ වූ රජයේ ඉඩම් කොටස කොමසාරිස් ජනරාල්, අම්පාර ප්‍රාදේශිය ලේකම් වෙතද 2015.08.11 ලිපියන් ඉඩම් කොමසාරිස් ජනරාල්, අම්පාර ප්‍රාදේශීය ලේකම් වෙතද නොපමාව අවශ්‍ය කටයුතු කර තමා වෙත බිම් කට්ටි ලබාදෙන ලෙස' දන්වා තිබූ බවද සඳහන් කර ඇත.

එසේ තිබියදී 2016.08.10 දින දරණ 4/10/37844 ලිපියෙන් තමාටද පිටපත් සහිතව අම්පාර සහකාර ඉඩම් කොමසාරිස් වෙත ඉඩම් කොමසාරිස් ජනරාල් 2015.04.06 දිනැතිව ලබාදි තිබූ බදු අනුමැතිය අවලංගු කිරීමට 2016.06.01 දින ඉඩම් ඇමතිතුමා අනුමැතිය ලබා දී ඇති බව දන්වා ඇති බවද එසේ බදු අනුමැතිය අවලංගු කිරීම සිදුකර ඇත්තේ, වෙනත් ධනපති මුදලාලි කෙනෙකුට අදාළ ඉඩම් කොටස ලබාදීමට යැයි සැක කරන බවත්, එම ක්‍රියාවලිය තුළ තමාගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවටත් කරුණු දක්වා ඇත.

උක්ත ධර්මසිරි මූණසිංහ මහතා ඉදිරිපත් කළ පැමිණිල්ලට අදාළ ඉඩම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ගොනුකරන HRC/AM/98/16/T/LP ගුණසිරි සිල්වා මහතා 'එම්පයර් ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් සයිකල් ස්ටෝර්' නැමැති ව්‍යාපාරය 1979 වර්ෂයේ ආරම්භ කොට 2018 වර්ෂය දක්වා සංවර්ධනයේදී තම ව්‍යාපාරික ස්ථානය සම්පූර්ණයෙන්ම මෙන් ඉවත් කිරීම සිදුකොට ප්‍රධාන මාර්ගය පුළුල් කරන ලද බව සඳහන් කර ඇත.

එසේම තම ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යාමේදී වසර කීපයක්ම හොඳම ව්‍යවසායකයාට හිමි රිදී හා ලෝකඩ සම්මාන හිමි වූ බවද දක්වා ඇත. දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පාර පුළුල් කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන ගිය දෙමහල් ගොඩනැගිල්ල කඩා දැමීමට සිදු වූ බවත්, එයට විකල්ප ඉඩමක් ලෙස අම්පාර ඔසුසල අසල පිහිටි හෙක්.0.0164 ක ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා තමාට ලබා දීමට

2010.03.25 දින සිට කටයුතු ආරම්භ කර තිබූ බවත් දක්වා ඇති අතර, එයට අදාළව හුවමාරු ලිපි හා දුරකථන, විදුලි බිල්පත් ඇතුළු ලිපිලේඛන 29 ක සාරාංශයක්ද ඉදිරිපත් කර ඇත.

තම ව්‍යාපාරික ස්ථානය අහිමිවීම මත ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම ප්‍රධාන මාර්ගයෙන් පිටත තමාගේ නිවස පිහිටි ස්ථානයේ ආරම්භ කිරීම නිසා එය ඉතා අඩාල තත්ත්වයට පත්වී තමාගේ ව්‍යාපාරික තොග විශාල ලෙස විනාශ වූ බවත්, ලබාදීමට කටයුතු කළ විකල්ප ඉඩම මේ දක්වා ලබා නොදීම මත තමා අගතියට පත්ව ඇති බවත් පවසා ඇත.

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-

ප්‍රාදේශීය ලේකම්, අම්පාර විසින් කොමිෂන් සභාව වෙත වාර්ථාවක් ඉදිරිපත් කරමින් ධර්මසේන මුනසිංහආරච්චි මහතා හා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා යන දෙදෙනාටම අම්පාර ඩී.එස්.සේනානායක වීදියේ අනුරේඛණ අංක AM/AM[/2012/359 දරණ හෙක්.0.0164 ක බිම් කොටස සඳහා අයිතිවාසිකම් ඉල්ලා සිටින බව දන්වා ඇත.

'එම්පයර් ඉලෙක්ට්‍රිකල්' ආයතනය අම්පාර ඩී.එස්.සේනානායක වීදිය පුළුල් කිරිමේදී සම්පූර්ණයෙන් ඉවත් කරන ගොඩනැගිල්ලක් සේ සලකා එම ආයතනයේ හිමිකරු වන ඒ.එච්.ගුණසිරි සිල්වා මහතාට විකල්ප ඉඩමක් ලෙස ඉහත සඳහන් ඉඩම් කොටස ලබා දීමට එවකට සිටි ප්‍රාදේශීය ලේකම් විසින් 012.07.03 දිනැති ලිපිය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ වාර්තා යවා ඇති බවද දන්වා ඇත. ඒ සඳහා 2012.08.12 දිනැතිව නාගරික සංවර්ධන අධාකරියේ අනුමැතිය ලැබී ඇති බවත්, 2012 සැප්තැම්බර් මාසයේ ඒ.එච් ගුණසිරි සිල්වා නමින් එම විකල්ප ඉඩම් කොටස මැන ඇති බවත් සඳහන් කර ඇත.

එසේ තිබියදී ප්‍රධාන මාර්ගය පුළුල් කිරිමේදී කඩා ඉවත් කරන ලද කොටසේ අනවසර ඉදිකිරීම් සිදුකිරීම හේතුවෙන් විකල්ප ඉඩම ඔහු නමින් නියමානුකූල කිරිමට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවන ලද නිර්දේශ වාර්තා 2017.02.07 දිනැති ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් අවලංගු කර ඇති බවද දන්වා ඇත.

ඒ අතරතුර ඩී.මුණසිංහ ආරච්චි මහතා 2013.02.22 ලිපිය මඟින් තමා 1977න් පසු තම ව්‍යාපාරික ස්ථානය අහිමිවීමෙන් දේශපාලන පළිගැනීම් වලට ලක්වූ බව පවසමින් මෙම අනවසර ඉදි කිරීම් සිදුකිරීම හේතුවෙන් විකල්ප ඉඩම ඔහු නමින් නියමානුකූල කිරිමට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවන ලද නිරිදේශ වාර්තා 2017.02.07 දිනැති ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් අවලංගු කර ඇති බවද දන්වා ඇත.
ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක LD/M/LC/C/90 හා 2013.02.27 දිනැති ලිපිය මඟින් 1977 දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට සහන සැළසීම යටතේ ඩී.මූණසිංහ ආරච්චි මහතා වෙත

අනුග්‍රාහක බදු පදනම මත  මෙම ඉඩම ලබා දීමට පියවර ගන්නා ලෙස දැනුම් දී ඇති අතර, ඒ අනුව 2015.09.04  දිනැති  ලිපිය මගින් ගුණසිර මහතාගේ විකල්ප ඉඩම සම්බන්ධ නිර්දේශ ලබාදී ඇති බව දන්වා ඇත.

ඉන්පසු නැවත ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා අනවසර ඉදිකිරීම් කළ කොටස නගර සභාවට භාර දීමට එකඟතාවය ප්‍රකාශ කිරිම හේතුවෙන් නැවත මුණසිංහ ආරච්චි නමින් යවන ලද නිර්දේශ වාර්තා අත්හිටුවා ඉඩම ගුණසිරි සිල්වා මහතාට  ලබා දෙන ලෙස ඉඩම් අමාත්‍ය 2013.12.02 දිනැති ලිපියෙන් දන්වා ඇති බවද සඳහන් කර ඇත.

නැවත මුණසිංහ ආරච්චි මහතා කරන ලද ඉල්ලීම අනුව අදාළ ඉඩම් කොටස නැවත ඔහු වෙත ලබා දීමට 2014.07.01 දිනැති ලිපිය මගින් ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති බවත්, ඒ අනුව අදාළ ඉඩම ඩී. මුණසිංහ ආරච්චි මහතා නමින් මැනීම සඳහා 2015/53 මැනුම් ඉල්ලීම 2015.11.24  දිනැතිව මැනුම් අධිකාරිය වෙත යැවූ බවද, එහිදී එම ඉඩම් කොටසේ අවම බෙදුම් භාගය වන  පර්චස් 06 ක සීමාව නොමැතිවීම මත (පර්.3.87) නාගරික සංවර්ධන අධිකාරියෙන් කළ විමසුම අනුව අදාළ ඉඩමේ භාවිතය හා අනෙකුත් කරුණු සලකා යම් සහනශීලි නිර්දේශ ඉදිරිපත් කළ හැකි බව මුණසිංහ ආරච්චි මහතාට දන්වා ඇති බවද පවසා ඇත..

එසේ තිබියදී මෙම ඉඩම් ගැටලුව සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් තමාගෙන් කරන ලද විමසුම අනුව ක්ෂේත්‍ර නිලධාරී වාර්තා ලබාගෙන දෙපාර්ශවය වෙතම අම්පාර නගරයේ වෙනත් ඉඩම් හා ගොඩනැගිලි පවතින බව තහවුරු වූ බැවින් දෙපාර්ශවයේම කරුණු විමසා උක්ත ඉඩම ලබාදීමට සුදුසුම පුද්ගලයා ඒ.එච්.ගුණසිරි සිල්වා බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත තමා දන්වා යැවූ බව ප්‍රාදේශීය ලේකම් සඳහන් කර ඇත.

2016.02.06 දිනැති හා අංක 4/10/37689/4/10/37844 දරණ වාර්තාව ඉදිරිපත් කරමින් ඉඩම් කොමසාරිස් ජනරාල් ඉහත දැක්වූ ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාවේ කරුණුම ඉදිරිපත් කර ඇත.

උක්ත ඉඩම සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් දෙදෙනාම හිමිකම් ඉල්ලා සිටින බැවින් තමා 2016.01.01 දිනැතිව ඉඩම් ලේකම්ගෙන් උපදෙස් විමසන ලද බවත්, එවිට පිළිතුරු ලෙස ඉඩම් ලේකම්ගේ 4-1/9/19/6/3/9  හා 2016.02.26 ලිපිය මගින් අදාළ පුද්ගලයන් දෙදෙනාට වෙනත් ඉඩම් පවතිද යන්න හා උක්ත ඉඩම ලබාදීමට වඩාත් සුදුසු පුද්ගලයා කවුරුන්ද යන්න නිර්දේශ කරන ලෙස දන්වන ලද බවද දක්වා ඇත.  ඒ අනුව අම්පාර ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාවක් කැඳවන ලද බවත්, 2016.03.21 දිනැතිව අම්පාර ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකරන ලද වාර්තාව අනුව එම ඉඩම ලබාදීමට සුදුසුම පුද්ගලයා

ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා බව නිර්දේශ වූ බවද එය 2016.04.11 දිනැති ලිපියෙන් ඉඩම් ලේකම් වෙත දන්වන ලද බවද පවසා ඇත.

ඒ අනුව විශයගත ඉඩම් කොටස ලබාදීමට වඩාත් සුදුසුම පුද්ගලයා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා නම් ඒ සම්බන්ධව නිර්දේශ සහිතව ගොනුව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනමෙන් තමා වෙත කළ දැන්වීම අනුව අංක 4/10/37689 හා 2016.05.12 දිනැති ලිපිය මගින් ඩී.මුණසිංහ ආරච්චි මහතා නමින් ලබාගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බවද සඳහන් කර ඇත.

එසේම මේවන තෙක් අදාළ ඉඩම ගුණසිරි .එච්.ගුණසිරි සිල්වා මහතා වෙත භාර දීමක් සිදුකර නොමැති අතර, දෙදෙනාම ඉඩම වෙනුවෙන් කිසිම බදු මුදලක් ගෙවා නොමැති අතර, ඉඩම තුල කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොමැති බවද දන්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරික්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

උක්ත පැමිණිල්ල සම්බන්ධයෙන් 2016.10.27, 2016.11.21 යන දිනවලදී පරික්ෂණ පැවැත්වීම සිදුකර ඇති අතර, එහිදී ඩී.මුණසිංහ ආරච්චි මහතා වෙත විකල්ප ඉඩමක් ලෙස රජයේ ඉඩමක් වශයෙන් පවතින සිතියම් අංක 280003 හී කැබලි අංක 255 ඉඩමෙන් පර්චස් 03 ක ප්‍රමාණයක් ලබාදීමට එකඟතාවයට පැමිණියද 2018.04.24 දින පැවති පරීක්ෂණයේදී නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ජනරාල් නියෝජිත අදාළ ඉඩමට යාබද ඉඩමේ පදිංචි අයගේ වැසිකිලිය හා නාන කාමරය ඉදිකිරීම සිදුකර ඇති බැවින් හා වතුර ගලායන කාණු පද්ධතිය පිහිටි බැවින් එම ඉඩම් කොටස ලබාදීම සුදුසු නොවන බව දැන්වා ඇත.

උක්ත තත්ත්වයන් මත එම විකල්ප ඉඩම් කොටස ලබාගැනීමට ඩී.මුණසිංහ ආරච්චි මහතාද එකඟ නොවන බවටත් කරුණු දක්වා ඇත. එසේම ප්‍රශ්නගත ඉඩම් කොටස රජයේ ඉඩමක් ලෙස මේ වනවිට පවතින බැවින් දෙකට බෙදා දෙදෙනා අතර බෙදාදීමෙන් මෙම ගැටලුව විසඳාගත හැකි බව ඩී.මුණසිංහ ආරච්චි මහතා යෝජනා කළ අතර ඒ සඳහා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා අකමැත්ත පළකොට ඇත. ඒඅනුව නිර්දේශයක් ලබාදෙන මෙන් පාර්ශවයන් ඉල්ලීම් කර ඇත.

ඩී.මුණසිංහ ආරච්චි මහතා හා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා අම්පාර නගරාශ්‍රිතව ස්ථිර පදිංචිය දරණ පුද්ගලයන් බව අනාවරණය වන අතර, ඩී.මුණසිංහ ආරච්චි මහතාගේ ව්‍යාපාරික ස්ථානය 1987 වර්ෂයේ අම්පාර බස් නැවතුම පුලුල් කිරීමේදී ඉවත් කර ඇති බවත්, ඔහු එය දේශපාලන පළිගැනීමක් ලෙස ඉවත් කළ බවත් දන්වා ඇත. අදාළ ව්‍යාපාරික ස්ථානය සඳහා අම්/වාබ 300 පර්.1 ½ක් සඳහා වාර්ෂික බලපත්‍රයක් 1975 ලබාදී ඇති බවද එසේම අදාළ ඉවත් කිරීම සඳහා වන්දි ලබාදී නොමැති බවද පැමිණිල්ල ඉදිරිපත් කරන කරුණු අනුව අනාවරණය වේ.

ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා තම වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල සමඟ ඉඩම් කොටස දැයට කිරුල යටතේ මාර්ගය පුළුල් කිරීමේදී ඉවත් කර ඇති අතර, එම ඉඩම සඳහා 1973.01.24 දිනැතිව අම්/වාබ606 වාර්ෂික බලපත්‍රය හෙ.0.0108 ක් සඳහා ලබා තිබූ බව අනාවරණය වේ. අදාළ ඉවත් කිරීම සඳහා වන්දි ලබාදීමක් සිදුව නොමැති බවද පැමිණිල්ලේ කරුණු අනුව අනාවරණය වේ.

ප්‍රාදේශිය ලේකම්, අම්පාර විසින් 1997.06.29 වනදින ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලද ලිපියක් මඟින් ඩී.මුණසිංහ ආරච්චි මහතාට බස් නැවතුම සඳහා අහිමිවූ ඉඩම වෙනුවෙන් වාණිජ ඉඩම් කැබැල්ලක් දීම නිර්දේශ කර උපදෙස් ඉල්ලා ඇති බව ප්‍රාදේශිය ලේකම්ගේ අංක අම්/ප්‍රාලේ/සං1/29 (IIIවෙලුම )අංක දරණ 1997.06.09 දිනැති ලිපිය අනුව අනාවරණය වේ.

1999.07.15 දිනැති 4/10/අම්පාර/විවිධ/ක.ව දරණ ඉඩම් කොමසාරිස් ගේ ලිපියෙන් ඩී.මුණසිංහ ආරච්චි මහතාට සුදුසු ඉඩම් කොටසක් තිබේද ඒ සඳහා ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ එකඟතාවය තිබේද යන්න විමසා ඇත. එසේම 2007.11.21 අම්/ප්‍රාලේ/සං/29(8) අංක දරණ ලිපිය මඟින් ප්‍රාදේශිය ලේකම් අම්පාර, ලේකම්, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කළ ලිපියෙන් ඩී.මුණසිංහ ආරච්චි මහතා වෙත දැනට ප්‍රශ්නගත ඉඩමෙන් පර්චස් 06 ක් දීමට හැකියාවක් ඇති බව අනාවරණය වේ.

සහකාර ඉඩම් කොමසාරිස් 2015.04.25 දිනැති අංක 4/10/37844 ලිපිය මඟින් ප්‍රශ්නගත ඉඩම දීර්ඝකාලින බදු පදනම මත ඩී.මුණසිංහ ආරච්චි මහතාට ලබාදීමට ඉඩම් ඇමති අනුමත කර ඇති බව දන්වා ඒ සඳහා ඉදිරි කටයුතු කරන ලෙස සහකාර ඉඩම් කොමසාරිස්, අම්පාර වෙත දන්වා ඇති බවද අනාවරණය වේ.

2010.12.28 දිනැති AM/DS/LVD/3/5/1 අංක දරණ ලිපිය මඟින් ප්‍රාදේශිය ලේකම්, අම්පාර ඒ.එච්. ගුණසිරි සිල්වා මහතාට ප්‍රශ්නගත ඉඩම් කොටස වෙන්කරදීම සුදුසු බව නිර්දේශ කර අනුමැතියට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇති බවද අනාවරණය වේ.

2012.07.30 දිනැති AM/DS/LND/3/5/1 දරණ ලිපිය මඟින් ප්‍රාදේශිය ලේකම්, අම්පාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි අම්පාර වෙත ප්‍රශ්නගත ඉඩම් කොටස ඒ.එච්.ගුණසිරි සිල්වා නමින් මැනුම් කටයුතු සිදුකරන ලෙස ඉල්ලීම් ලිපියක් යවා ඇති බවද ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා ගොඩනැගිලි සැලැස්ම අනුමත කරගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත රුපියල් 5749.24 මුදලක් බැඳ ඇති බවද අනාවරණය වේ.

2012.11.03 දිනැති AM/DS/LND/3/5/1 ලිපිය මඟින් ප්‍රාදේශිය ලේකම් අම්පාර, සභාපති අම්පාර නගර සභාව වෙත ප්‍රශ්නගත ඉඩම ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා නමින් දීර්ඝ කාලින බදු බලපත්‍රයක් මඟින්

ලබාදීමට අවශ්‍ය කටයුතු කරගෙන යන බැවින් වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරිමට අවසරදීම සම්බන්ධයෙන් තමාගේ විරෝධතාවයක් නොමැති බව දන්වා ඇති බව අනාවරණය වන අතර, ගුණසිරි සිල්වා මහතා නගර සභාව වෙත ගොඩනැගිලි සැලසුමක්ද අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව අනාවරණය වේ.

ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා දැයට කිරුළ යටතේ මාර්ගය සංවර්ධනය කිරීමේදි ඉවත් කළ ගොඩනැගිල්ලේ ඉතිරි කොටසේ ඉදිකිරිම් කටයුතු සිදුකිරිම හේතුවෙන් ප්‍රශ්නගත විකල්ප ඉඩම සම්බන්ධ නිර්දේශය 2013.02.07 දිනැති ලිපියෙන් අවලංගු කර ඇති බව අනාවරණය වේ.

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ LO/ M/LC/90 හා 2013.02.27 දිනැති ලිපියෙන් ඩි.මුණසිංහ ආරච්චි මහතා වෙත ප්‍රශ්නගත ඉඩම අනුග්‍රාහක බදු පදනම යටතේ ලබාදීමට පියවර ගන්නා ලෙස ප්‍රාදේශිය ලේකම් වෙත දන්වා ඇති අතර, ඒ අනුව 2013.04.04 දිනැති ලිපියෙන් ඩි.මුණසිංහ ආරච්චි මහතා වෙත අදාළ ඉඩම ලබාදිමට ප්‍රාදේශිය ලේකම් නිර්දේශය ලබාදි ඇත.

නැවත ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා අදාළ ඉඩම තමා වෙත දීර්ඝකාලින බදු පදනම මත ලබාදෙන ලෙසත්, තමා දැනට ඉදිකිරිම් කරන ඉදිරිපත් කළ ගොඩනැගිල්ලට අයත් කොටස නගර සභාවට ලබාදීමට කටයුතු කරන බවට කළ දැන්විම අනුව 2013.12.02 ලිපියෙන් ඉඩම් අමාත්‍ය ප්‍රාදේශිය ලේකම් වෙත දන්වා ඇති බව අනාවරණය වේ.

උක්ත ඉඩම් කොටස දෙපාර්ශවය වන ඒ.එච්.ගුණසිරි සිල්වා, ඩි. මුණසිංහ ආරච්චි යන දෙදෙනා විසින්ම ඉල්ලා සිටි බවත්, දෙදෙනාටම අයත් වෙනත් ඉඩම් පවතිද යන්න හා උක්ත ඉඩම ලබාදිමට වඩාත් සුදුසු පුද්ගලයා කවුරුන්ද යන්න ඉඩම් කොමසාරිස් ජනරාල් 2016.03.21 දරණ ලිපිය මගින් අම්පාර ප්‍රාදේශීය ලේකම් විසින් විමසිමක් කර ඇති බවත් අනාවරණය වේ.

ඉඩම් කොමසාරිස් ජනරාල් 2016.05.21 දින කළ දැන්විමට අනුව තමා ක්ෂේත්‍ර නිලධාරි වාර්තා ලබාගෙන උක්ත ඉඩම ලබාදීම සඳහා සුදුසුම පුද්ගලයා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැන්වූ බව ප්‍රාදේශිය ලේකම් අම්පාර 2016.09.02 දිනැති AM/DS/LAD/3/5/1 වාර්තාව මගින් කොමිෂන් සභාව වෙත දන්වා ඇති අතර, ඉඩම් කොමසාරිස් ජනරාල් 2016.03.21 දින කළ දැන්විම අනුව තමා ක්ෂේත්‍ර නිලධාරි වාර්තා ලබාගෙන උක්ත ඉඩම ලබාදිම සඳහා සුදුසුම පුද්ගලයා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැන්වූ බව ප්‍රාදේශිය අම්පාර 2016.09.02 දිනැති AM/DS/LAD/3/5/1 වාර්තාව මගින් කොමිෂන් සභාව වෙත දන්වා ඇති බව අනාවරණය වේ.

2018.05.02 දිනැතිව කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ඩී. මුණසිංහ ආරච්චි මහතා තමා පදිංචි නිවස පිහිටි ඉඩම හැර වෙනත් කිසිදු ඉඩමක් ශ්‍රී ලංකාවේ කුමන පලාතකවත් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති බව අනාවරණය වේ.

ගැටළුවට තුඩු දී ඇති ඉඩම මුණසිංහ මහතා වෙත ලබාදීමට හැකියාව ඇති බව හා එයට අදාළ කටයුතු සිදුකිරිම 2007 වර්ෂයේ සිට සිදුව ඇති බව අම්පාර ප්‍රාදේශිය කාර්යාලය විසින් ලේකම් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කළ 2017.11.21 දිනැති අම්/ප්‍රාලේ/සං/29/08 දිනැති ලිපිය මඟින් අනාවරණය වේ.

ප්‍රශ්නගත ඉඩම් කොටස ඒ.එච්.ගුණසිරි සිල්වා මහතාට ලබා දීමට අනුමැතිය 2010 වර්ෂයේ ලබාදී ඇති බව 2010.12.28 දින ඉඩම් කොමසාරිස් වෙත අම්පාර ප්‍රාදේශිය ලේකම් විසින් යොමුකළ AM/DS/LND/3/5/1 ලිපිය මඟින් අනාවරණය වේ.

එසේම ප්‍රශ්නගත ඉඩම සඳහා සුදුසුම පුද්ගලයා තේරිමේදි කැඳවූ ක්ෂේත්‍ර නිලධාරි වාර්තා කොමිෂන් සභාව ප්‍රාදේශිය ලේකම්ගෙන් ඉල්ලා ඇතත්, එයට යොමු කර ඇති පිළිතුරු ලිපිය අනුව ඒ සඳහා ක්ෂේත්‍ර නිලධාරි වාර්තාවක් කැඳවිමක් සිදුකර නොමැති බව අනාවරණය වී ඇත.

අම්පාර ප්‍රාදේශිය ලේකම් යොමුකළ 2018.07.20 දිනැති වාර්තාව අනුව ප්‍රාදේශිය ලේකම් උක්ත ඉඩම ලබා දීමට වඩාත් සුදුසු පුද්ගලයා තේරීමේදී ඉඩම් අහිමි වූ කාල වකවානුව පිළිබඳ අවධානය යොමු කර තීරණ ගෙන ඇති බවත්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව ක්ෂේත්‍ර නිලධාරී වාර්තා කැඳවා පැමිණිලිකරුවන් දෙදෙනාට වෙනත් ඉඩම් හා ගොඩනැගිලි ඇද්ද යන්න පරීක්ෂා කිරීම සිදු කර නොමැති බවත් අනාවරණය වේ.

2016.10.27 දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී ඩී. මුණසිංහ ආරච්චි මහතා වෙත විකල්ප ඉඩමක් ලෙස අම්පාර උහන පාරේ කඩඉම් සිතියම් අංක 280003 හි කට්ටි අංක 255 දරණ බිම් කොටසින් පර්චස් 05 ප්‍රමාණයක් දීමට තීරණය කළද අදාළ ඉඩම් කොටස අසල පුද්ගලයන්ගේ සනිපාරක්ෂක පහසුකම් සපයාගන්නා ඉදිකිරිම් පැවතිමත් ව්‍යාපාරික ස්ථානයක් සඳහා ප්‍රමාණවත් නොවිමත් හා ජලබැස්මක් සහිත වීමක් මත එය විකල්ප ඉඩමක් ලෙස බැහැර කිරිමට නොහැකි බව අම්පාර සහකාර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කර ඇති බව අනාවරණය වේ.

නිගමනය :-

එකම වාණිජ ඉඩම් කොටස දෙදෙනෙක් ඉල්ලා සිටීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ වාර්තා කැඳවා ඔවුන් දෙදෙනාට ඇති වෙනත් වානිජ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පරීක්ෂා කර වඩාත් සුදුසු පුද්ගලයා තේරීම සිදුකළ යුතු වේ.

එසේ තිබියදී සිය රාජකාරී බලය භාවිත කරමින් ක්ෂේත්‍ර නිලධාරී වාර්තා කැඳවා වඩාත් සුදුසු පුද්ගලයා ලෙස කෙනෙකු නම් කිරීම ගැටලු සහගත වන අතර, එමඟින් රාජ්‍ය නිලධාරීන් අපක්ෂපාතීව කටයුතු කිරීමේදී වගකීම පැහැර හැර ඇති බව අනාවරණය වේ.

1978 වර්ෂයේ සිය වාණිජ බිම අහිමි වූ දින සිටම ඒ සඳහා වන්දියක් හෝ නොලබා විකල්ප වාණිජ ඉඩමක් ලබා දෙන ලෙස ඩී. මුණසිංහ ආරච්චි මහතා ඉල්ලුම් කර ඇති අතර, ඒ අනුව 2007 වර්ෂයේ ප්‍රශ්නගත ඉඩම් කොටස ඩී. මුණසිංහ ආරච්චි මහතා වෙත ලබාදීමට නිර්දේශ ලබා දී එය ලබාදීමට අදාළ කටයුතු රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකිරීම හා එම කටයුතු පමාකිරීම හේතුවෙන් අදාළ ඉඩම් කොටස ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා විසින් ඉල්ලා සිටීම සිදුව ඇති බව අනාවරණය වේ. එසේම සිය පැමිණිල්ලෙන් ඉදිරිපත්කර ඇති කරුණු අනුව තම නිවස ඉදිරිපිට ව්‍යාපාරක ගොඩනැගිල්ලක ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා තම ව්‍යාපාරය මේ වන විටද පවත්වාගෙන යන අතර කිසිදු ව්‍යාපාරික ගොඩනැගිල්ලක් නොමැති වීම මත ඩී. මුණසිංහ ආරච්චි මහතාට සිය ව්‍යාපාරික කටයුතු 1978 සිට නතර කර දැමීමට සිදුව ඇති බවද ඔහුගේ පැමිණිල්ලේ කරුණු දැක්වීම මඟින් අනාවරණය වේ.

විශේෂයෙන්ම මුණසිංහ ආරච්චි මහතා වෙත 2007 නිර්දේශ වූ වාණිජ ඉඩම ඔහු වෙත දීර්ඝ කාලීන බදුකරයකින් පැවරීමේ කටයුතු ප්‍රමාද කිරීම මෙන්ම ඉඩම් කොමසාරිස් ජනරාල් පැමිණිලිකරුවන් දෙදෙනාට ඇති වෙනත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සොයාබලා අදාළ ඉඩම පැවරීමට සුදුසුම පුද්ගලයා කවුද යන්න සඳහන් කර එවන ලෙස කරන ලද ඉල්ලීමේදී ඒ පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරී වාර්තා කැඳවීමකින් තොරව සිය අභිමතය පරිදි ලැබිය යුතු සුදුසුම පුද්ගලයා ඒ.එච්.ගුණසිරි සිල්වා මහතා නම් කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති ඩී. මුණසිංහ ආරච්චි මහතාගේ 'නීතියේ සමාන රැකවරණය ලැබීමේ අයිතිය' අහිමි වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය තුළ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, ප්‍රශ්නගත අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ

සේනානායකපුර ග්‍රාම නිලධාරි වසමට අයත් කඩඉම් සිතියම් අංක 280001 හි කැබලි අංක 581 දරණ පර්චස් 3.87 ක ඉඩම් ප්‍රමාණය ඩී. මුණසිංහ ආරච්චි මහතා වෙත දීර්ඝකාලින බදු පදනම මත ලබාදීමට පියවර ගත යුතු බවටත්,

02. ඒ.එච්.ගුණසිරි සිල්වා මහතාටද විකල්ප වාණිජ ඉඩම් කොටසක් දීර්ඝ කාලින බදුපදනම මත ලබාදීමට කටයුතු කළ යුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 12 . 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
[illegible] of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
ඉඩම් අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් ලේකම් කාර්යාලය,
නො : 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අම්පාර.

B/